**ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් මධ්‍යම පළාත් අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීම සඳහා වූ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදීමේ පරිපාටිය**

**1. සේවා පළපුරුද්ද**

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ වසර 03ට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයට අමතරව වන, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයට වසරකට ලකුණු 03 බැගින් හිමි වේ.

***උපරිම ලකුණු - 30***

**2. අධ්‍යාපන සුදුසුකම්** *(ලකුණු - 08)*

2.1 දර්ශනශූරී උපාධි (PhD) *(ලකුණු - 06)*

2.2 දර්ශනපති උපාධි (M Phil) *(ලකුණු - 05)*

2.3 පළමු පංතිය/ශ්‍රේණියට උසස්වීමේදී සලකා නොබැලූ පශ්චාත් උපාධි (MA, MSc, MBA වැනි) *(ලකුණු - 04)*

2.4 කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කිරීමේදී සලකා නොබැලූ පශ්චාත් උපාධි *(ලකුණු - 03)*

2.5 සේවයට බඳවා ගැනීමට සුදුසුකම වූ ප්‍රථම උපාධියට අමතරව ලබා ඇති ප්‍රථම උපාධි (උදා- LLB, BIT වැනි)

(මෙහිදී ලකුණු ලබාදෙනු ලබන්නේ, බඳවා ගැනීමේදී සුදුසුකමක් ලෙස සැලකූ උපාධිය, කාර්යක්ෂමතා කඩඉම් නිදහස් කිරීම හා ශ්‍රේණි උසස් කිරීම සඳහා සලකා බැලූ පශ්චාත් උපාධි ඩිප්ලෝමා/පශ්චාත් උපාධි හැර, අනෙකුත් සුදුසුකම් අතරින්, එක් එක් ක්ෂේත්‍රයේ ඉහලම සුදුසුකම් සඳහා පමණි.)

***උපරිම ලකුණු - 08***

**03. ක්ෂේත්‍රයෙහි සේවා පළපුරුද්ද**

අදාළ පත්වීම් බලධාරීන් විසින් නිකුත් කර ඇති විධිමත් පත්වීම් ලිපි සඳහා පමණක් උපරිම ලකුණු සීමාවට යටත්ව ලකුණු ලබා දෙනු ලැබේ.

3.1 පාසල් කළමනාකරණයේ පළපුරුද්ද *(ලකුණු - 05)*
(ශ්‍රී ලං.අ.ප.සේ. සඳහා අනුමත විදුහල්පති තනතුරක එක් වසරකට ලකුණු 01 බැගින්)

3.2 කාර්යාල කළමනාකරණයේ පළපුරුද්ද *(ලකුණු - 10)*
(විදුහල්පති තනතුරක හැර ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ වෙනත් තනතුරක එක් වසරක සේවා කාලයක් සඳහා ලකුණු 01 බැගින්)

***උපරිම ලකුණු - 15***

**04. නිර්මාණශීලීත්වය හා වෘත්තීය සංවර්ධනය**

4.1 වෘත්තීය ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ

(පශ්චාත් උපාධියට/පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනයට අදාළ වූ පර්යේෂණ/නිබන්ධන සඳහා ලකුණු ලබාදෙනු නොලබන අතර, වෘත්තීය ක්ෂේත්‍රයට අදාළව ප්‍රසිද්ධ සාකච්ඡා මණ්ඩපයකට ඉදිරිපත් කරන ලද විධිමත්ව අවසන් කරන ලද එක් පර්යේෂණ වාර්තාවකට ලකුණු 04 බැගින් උපරිම පර්යේෂණ 02ක් සඳහා ලකුණු දෙනු ලැබේ.)

4.2 ප්‍රකාශයට පත් කර ඇති සඟරා, ලිපි, ප්‍රකාශන ආදිය

(පෙළපොත් හා ඒ ආශ්‍රිත පරිශීලන ග්‍රන්ථ සඳහා ලකුණු ලබාදෙනු නොලබන අතර, අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශන මණ්ඩලය මගින් අනුමැතිය ලද ග්‍රන්ථ සඳහා පමණක් ද පුවත්පත් හා සඟරාවල පළ කර ඇති ලිපි, වාර්තා හෝ ශාස්ත්‍රීය ප්‍රකාශන සඳහා ලකුණු ලබාදීමේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීම සුදුසු යැයි තීරණය කරනු ලබන ප්‍රකාශන සඳහා එක් ප්‍රකාශනයකට ලකුණු 02 බැගින් උපරිම ප්‍රකාශන 02ක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.)

***උපරිම ලකුණු - 12***

**05. පරිගණක සාක්ෂරතාව පිළිබඳ දැනුම** (ඉහළම සහතිකයට පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.)

5.1 උපාධිය/උපාධි ප්‍රධාන විෂයයක්/පශ්චාත් උපාධි *(ලකුණු - 04)*

5.2 මාස 06ට වැඩි සහතික පත්‍ර/පුහුණු පාඨමාලා/ඩිප්ලෝමා *(ලකුණු - 03)*

5.3 මාස 03ට වැඩි මාස 06 දක්වා සහතික පත්‍ර/පුහුණු පාඨමාලා/ඩිප්ලෝමා *(ලකුණු - 02)*

5.4 සති 02ට වැඩි මාස 03 දක්වා සහතික පත්‍ර/පුහුණු පාඨමාලා (ලකුණු - 01)

උපරිම ලකුණු - 04

**06. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව (ඉහළම සහතිකයට පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.)**

6.1 ඉංග්‍රීසි විෂය සහිත උපාධි/ඉංග්‍රීසි මාධ්‍ය උපාධි/ඉංග්‍රීසි මාධ්‍ය පශ්චාත් උපාධි (ලකුණු - 05)
6.2 අ.පො.ස.(උ/පෙළ) ප්‍රධාන විෂයක් ලෙස ඉංග්‍රීසි විෂය සමත් වී තිබීම (ලකුණු - 04)
6.3 වසරක කාලයකට වැඩි ඩිප්ලෝමා පාඨමාලා (ලකුණු - 03)
6.4 මාස 06 හෝ 06ට වැඩි, අවු.01ට අඩු ඩිප්ලෝමා/සහතික පත්‍ර පාඨමාලා (ලකුණු - 02)
6.5 මාස 06ට අඩු - සහතික පත්‍ර පාඨමාලා (ලකුණු - 01)

උපරිම ලකුණු - 05

**07. සේවා ඇගයීම/ප්‍රශංසා සහතික (පොදු 230 බී ආකෘතිය)/සම්මාන සහතික/ජයග්‍රහණ**

7.1 ජාතික මට්ටම - (ලකුණු 10 බැගින් 01ක් පමණක් සළකනු ලැබේ)
7.2 පළාත් මට්ටම - (ලකුණු 04 බැගින් 02ක් පමණක් සළකනු ලැබේ)
7.3 කලාප මට්ටම - (ලකුණු 03 බැගින් 02ක් පමණක් සළකනු ලැබේ)

උපරිම ලකුණු - 10

**08. ආයතනික, කළමනාකරණය, පරිපාලනමය, අධ්‍යාපනික කරුණු සම්බන්ධ දැනුම/හැකියාව/අවබෝධය පිරික්සීම**

8.1 ආයතනික කළමනාකරණය හා පරිපාලනය (ලකුණු - 02)
8.2 අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ න්‍යායාත්මක දැනුම (ලකුණු - 02)
8.3 අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ කාලීන ගැටළු හා උපායමාර්ගික යොජනා (ලකුණු - 02)

(අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සම්බන්ධ කරගනිමින් යථෝක්ත කරුණු සම්බන්ධයෙන් පෙර සූදානම් කර ගත් එක් එක් ප්‍රශ්නයට අදාළ ලකුණු සංඛ්‍යාව සඳහන් සමරූපී ප්‍රශ්නාවලි කිහිපයක් අතුරින්, අයදුම්කරු විසින් අහඹු ලෙස තෝරා ගනු ලබන ප්‍රශ්නාවලිය සඳහා ලකුණු ලබාදෙනු ලැබේ.)

උපරිම ලකුණු - 06

**09. සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන සමස්ත කුසලතාව**

9.1 නායකත්වය හා පෞරුෂය (ලකුණු - 04)
9.2 සන්නිවේදන හැකියාව (ලකුණු - 03)
9.3 ආකල්ප (ලකුණු - 03)

උපරිම ලකුණු - 10

<u>මුළු ලකුණු 100</u>

.......................................
සකස් කලේ

කේ.ඩී.එම්.ඒ.කේ. ඇලිකේවෙල
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය
මධ්‍යම පළාත

කේ. ඩී. එම්. ඒ. කේ. ඇලිකේවෙල
නියෝජ්‍ය අධ්‍යක්ෂ (අධ්‍යාපන),
ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය,
මධ්‍යම පළාත.

.......................................
පරීක්ෂා කලේ

පී.මද්දුමආරච්චි
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය
මධ්‍යම පළාත

.......................................
අනුමත කලේ

එච්.එම්. එම්.යූ.බී.හේරත්
ලේකම්
ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය
මධ්‍යම පළාත

එච්. එම්. එම්. යූ. බී. හේරත්
ලේකම්
ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය
පළාත් සභා සංකීර්ණය
පල්ලේකැලේ - කුණ්ඩසාලේ